**ශීර්ෂ 312 - බස්නාහිර පළාත් සභාව - 2023**

**1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය**

**1.1 දැක්ම**

සහජීවනය සහ තිරසාර සංවර්ධනය තුළින් බස්නාහිර පළාත පෙරට

**1.2 මෙහෙවර**

මූල්‍ය, භෞතික හා මානව සම්පත් ප්‍රශස්ථ ලෙස මෙහෙයවමින් සියළු ප්‍රජාවට සෙත සැළසෙන සාමය හා සහජීවනයෙන් පිරි තිරසාර සංවර්ධනයක් උදාකිරීම.

**1.3 කාර්යභාරය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

**2. මුළු ප්‍රතිපාදනය හා වියදම**

බස්නාහිර පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 68,597 ක්වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට එයින් රු.මිලියන 62,073.81 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව, ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 6,523.19 ක් හෙවත් සියයට 9.5ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2023 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | % |
| පුනරාවර්තන | 65,229.00 | 59,476.66 | 5,752.34 | 8.82 |
| මූලධන | 3,368.00 | 2,597.15 | 770.85 | 22.89 |
| එකතුව | 68,597.00 | 62,073.81 | 6,523.19 | 9.51 |

**3. විගණන නිරීක්ෂණය**

ඉහත ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන පළාත් සභාව විසින් පළාත් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනය කර තිබුණි. පළාත් සභාවේ අරමුදල විගණනය කර ඒ පිළිබඳව විගණකාධිපති වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.